**බැංකු පනත් විධාන 2018 අංක 10** 2018 නොවැම්බර් 30

## බලපත්‍රලාභී බැංකු සඳහා නියෝජිතයන් පත් කිරීම පිළිබඳ විධාන සංශෝධනය කිරීම

2018 මැයි 24 දින නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා නියෝජිතයන් පත් කිරීම පිළිබඳ 2018 අංක 02 දරන බැංකු පනත් විධානයන්ගේ විධාන අංක 06 පහත සඳහන් නව විධානය මගින් ප්‍රතිස්ථාපනය කෙරේ.

6. අනුමත නියෝජිත බැංකු කටයුතු

6.1 නියෝජිතයන් විසින් පහත සඳහන් බැංකු සේවා/පහසුකම් බැංකුවේ දැනට සිටින ගනුදෙනුකරුවන්ට පමණක් ලබා දිය යුතුය.

(i) තැන්පතු භාර ගැනීම

(ii) තැන්පතු ආපසු ගෙවීම

(iii) ණය ආපසු ගෙවීම් භාර ගැනීම

(iv) ණය කාඩ්පත් ගෙවීම් භාර ගැනීම

(v) බිල්පත් ගෙවීම් පහසුකම් සැලසීම

(vi) ගිණුම් ශේෂ ඉල්ලීම්

(vii) එකම බලපත්‍රලාභී බැංකුව තුළම සිදු වන අරමුදල් හුවමාරු සහ

(viii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන අනෙකුත් ඕනෑම කටයුත්තක්

6.2 නියෝජිතයින් විසින් බලපත්‍රලාභී බැංකු වෙනුවෙන් ගනුදෙනුකරුවන් මුණගැසී කරනු ලබන මුදල් බෙදාහැරීමේ හෝ හෝ එකතු කිරීමේ කටයුතුවලට අදාළ මුදල් ප්‍රවාහන කටයුතු විධාන 6.1 (viii) යටතට අයත් වේ. මෙකී කාර්යයන් පූර්ණ රක්ෂණාවරණයක් යටතේ සිදු කළ යුතු අතර තෙවන පාර්ශ්වයක් විසින් සිදු කරන මුදල් ගබඩා කර තැබීම්, එකතු කිරීම් හා බෙදා හැරීම් යන සියලුම කාර්යයන්හි දී සිදු විය හැකි අවදානම් සඳහා රක්ෂණ හිමිකම් පෑමට බලපත්‍රලාභී බැංකුවට හැකි විය යුතුය. මෙහිදී විධාන 9.1 (vii) මෙම කටයුතු සඳහා අදාළ නොවේ.

6.3 නියෝජිතයන් විසින් පැමිණෙන ප්‍රේෂණ මුදල් (inward remittances) බෙදා හැරීමේ සේවාව ද ලබා දිය හැක.

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**